සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2017** **09 ශ්‍රේණිය**
**Frist Term Test 2017** **Grade 09**

**සිංහල භාෂාව හා සාහිත්‍ය**

**පැය දෙකයි විනාඩි තිහයි(2.30)**

---

'අ' කොටස

සැලකිය යුතු යි.

* **දී ඇති උපදෙස් පරිදි අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට** නිවැරදි පිළිතුරු සපයන්න.

01. සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් **තාලුජ අකුරු** පමණක් ඇතුළත් පිළිතුර,
   i. ග,ජ,ඩ,ද,බ වේ. ii. ක,ච,ට,ත,ප වේ.
   iii. ක,ඛ,ග,ඝ,ඞ වේ. iv. ච,ඡ,ජ,ඣ,ඤ වේ.

02. නිවැරදි අකෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.
   i. ත්‍යාග ප්‍රධානය ii. ලේඛම්තුමා
   iii. මර්ධනය iv. කොට්ඨාසය

03. මුලින් දී ඇති රූඪී පදයෙහි අදහස ඇතුළත් වරණය තෝරන්න.
   **සායම ගියා**
   i. ඇඳුම්වල පාට ඉවත් වුණා. ii. ගෞරවය කෙළසුණා.
   iii. තීන්ත සේදී ගියා. iv. ආදායම පහත වැටුණා.

04. පය බරවායට .................... බෙහෙත් බැන්දා වගේ.
   i. පිට වට ii. හිස වට
   iii. පිටිකර iv. වළලුකර

05. ලජ්ජා නැතිකම ..................... වඩා ලොකු යි.
   i. මහමුදලිකමටත් ii. රජකමටත්
   iii. සහෝදරකමටත් iv. නෑකමටත්

06. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදය ඇතුළත් වරණය තෝරන්න.
   i. **රන්** - ස්වර්ණ, කනක, කාංචන, කසුන් ii. **ජලය** - පැන්, උදක, අඹ, නී
   iii. **සතුට** - සොම්නස, සතොස, ප්‍රමෝදය, ප්‍රහර්ෂය iv. **පිපි** - විකසිත, පුබුදු, විසල් ,පුල්

07. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදය ඇතුළත් වරණය තෝරන්න.
   i. චල - නිශ්චල ii. වංක - අවංක
   iii. විපක්ෂ - ප්‍රතිපක්ෂ iv. යෝග - වියෝග

08. මුලින් දී ඇති යුගල පදයට අනුව **නොගැළපෙන** යුගල පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   i. **මුදල් හදල්** - ළමයි බමයි, රොඩු බොඩු, ගසා බසා, ඔප්පු තිරප්පු ii. **අඟර දඟර** - උසුළු විසුළු, ඇදල පැදල, අහල පහළ, අබල දුබල
   iii. **එහෙ මෙහෙ** - ඉහළ පහළ, සමිති සමාගම්, දුකට සැපට, උඩක් බිමක් iv. **කවා පොවා** - කර කියා, දුවල පැනල, හිතල බලල, ලියා කියා

09. 'ත' වර්ගයට අයත් අකුරු **පමණක්** ඇතුළත් වචනය වන්නේ,

| | |
|---|---|
| i. තද්ධිත ය. | ii. කෘදන්ත ය. |
| iii. තත්භව ය. | iv. තත්සම ය. |

10. රේඵය, රකාරාංශය, ගයනුකිත්ත, යංශය **පිළිවෙලින්** ඇතුළත් පිළිතුර නම්,

| | |
|---|---|
| i. ක්‍රමය, මධ්‍යම,ලෞකික, වීයැී යි | ii. වීයැී ක්‍රමය, ලෞකික, මධ්‍යම යි. |
| iii. මධ්‍යම, ලෞකික, ක්‍රමය, වීයැී යි. | iv. වීයැී, ලෞකික, ක්‍රමය, මධ්‍යම යි. |

11. මුලින් දි ඇති උක්ත රූපයෙහි **වැරදි** අනුක්ත රූපය සහිත පිළිතුර කුමක් ද?

| | |
|---|---|
| i. ගැහැනියක් - ගැහැනියෙකු | ii. බල්ලෝ - බල්ලන් |
| iii. ඔබ - ඔබ | iv. මොවුහු - මොවුන් |

12. ජාති නාමයක්, සංඥා නාමයක්, ගුණ නාමයක් පමණක් ඇතුළත් පිළිතුර නම්,

| | |
|---|---|
| i. අරලිය, කැවිලි, රත්නපුර | ii. මීරිගම, අලස, ජනේලය |
| iii. ලෝහ, රාජසිංහ, දව | iv. බළල්, කහවත්ත, කෑදර |

ප්‍රශ්න අංක 13.14,15 වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.

13. අපි මෙවර විභාගයෙන් සමත් .............. (වේ වා/ වෙත් වා/ වෙම් වා/ වෙමුවා)

14. සමහර කෙනෙක් ඇතැම්විට අපට තෑගි භෝග ............... ( එව යි/ එවති/ එවන්නේ ය/ එවන්නී ය.)

15. තෙරුන් වහන්සේ දහවල් දානයට වැඩම .............. (කළේ ය/ කළා ය/ කළ සේක/ කරන්නේ ය.)

අංක 16 සිට 20 තෙක් 'අ' තීරුවේ ප්‍රකාශයට ගැළපෙන ප්‍රකාශය 'ආ' තීරුවෙන් තෝරා එයට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

| 'අ' තීරුව | | 'ආ' තීරුව |
|---|---|---|
| 16. මග දිගට ජනකතා කෘතිය | (.............) | i. බහුශ්‍රැතයින් විසින් දෙනු ලබන උපදේශ |
| 17. ආප්තෝපදේශ | (.............) | ii. ජාතික නර්තන දිනය |
| 18. ආචාර්ය එස් පණීභාරතී | (.............) | iii. සුනිල් සාන්ත |
| 19. ස්ටීවන් හෝකින් | (.............) | iv. ඩී.පී. වික්‍රමසිංහ මහතා |
| 20. මල් මල් වාරම් හරි ම උදාරම් | (.............) | v. කටුවක් තුළ ඇති විශ්වය කෘතිය |

21. මධ්‍යම පුරුෂ නාමපද **පමණක්** ඇතුළත් පිළිතුර වන්නේ,

| | |
|---|---|
| i. ඈ, නුඹ, අප, ඔබ ය. | ii. යුෂ්මතා, තෝ. ඔබලා, නුඹ ය. |
| iii. මා,එයාලා, තොපි, ළමයි ය. | iv. පියල්, නුඹලා, අපි. එයා ය. |

අංක 22.23,24ට අයත් වාක්‍යවල **ඉරි ඇඳි** බහු අර්ථ පදයේ අදහස ඉදිරියෙන් ඇති හිස්තැනින් ලියන්න.

22. මා **පිය** දියණී සිංහ සීවලී.. ......................................

23. **පිය** රජුගේ අන නො ඉක්මවනු පුතුනේ. ......................................

24. ඇසි**පිය** හෙළන පමණින් නොවෙති දෙවඟන. ....................................

ප්‍රශ්න අංක 25,26,27 යටතේ දී ඇති පුරුෂවාචී නාම පදවලට ගැළපෙන ස්ත්‍රීවාචී නාමපද ලියා දක්වන්න.

25. මැති .............................

26 එළුවා .............................

27. සොරා .............................

දී ඇති වාක්‍ය අනාගත කාලයට හරවා නැවත ලියන්න

28. දෙමාපියන්ට නිතර ගරුකළ ඔහු දියුණුවෙන් දියුණුවට පත්විය.
......................................................................................................

අංක 29,30 යටතේ දී ඇති විස්තරයට ගැළපෙන තනිපද මොනවාදැ යි ලියා දක්වන්න.

29. කළ වරද ගැන කනගාටු වීම. ..................................................................................

30. පළමු වරට සිරිපා කරුණා කරන්නා. ..................................................................................

(ලකුණු 1x30 = 30 යි)

## 'ආ' කොටස

* සියලු ම ප්‍රශ්නවලට උත්තර ලියන්න.

01. විවිධ මාධ්‍ය භාවිතය පාඩමට අදාළ ව ඔබ විසින් සකස් කරන ලද කුඩා පොත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබ පොතට යෙදූ නම කුමක් ද? (ලකුණු 02යි)
ii. පොතට තොරතුරු ඇතුළත් කිරීම සඳහා ඔබ විසින් පරිශීලනය කළ විවිධ මාධ්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04යි)
iii. පොත සකස් කිරීමෙන් ඔබ ලැබූ අත්දැකීම් තුනක් ලියන්න. (ලකුණු 06යි)
iv. විවිධ මාධ්‍ය භාවිතයෙහි ඇති වාසි තුනක් ලියන්න. (ලකුණු 03යි)

02. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු රචනාවක් ලියන්න.

i. පරිසරය සමගින් අප ද සුරකෙමු.
ii. අලස නොවී විවේකය ගනිමු.
iii. සමගිය සැබෑ සක්තිය යි.
iv. ස්ටීවන් හෝකින්
v. වනගත පරිසරයක අත්දැකීම සැබෑ ලෙස විඳගන්නට කලකින් ලැබුණු අවස්ථාව නිසා ම කුරුලු ගී හඬින් ද තුරුලතාවන්හි සිසිලසින් ද මත් වූ මට අවට සිරි නැරඹීම මිස කිසිවක් මතක නැත. හදිසියේ ම පයට පැගුණු යමක් නිසා මාගේ අවධානය එයට යොමු කළෙමි. දෙවියනේ.... !

(ලකුණු 20යි)

03. පහත සඳහන් පද්‍ය ඛණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ඇසෙයි අලුයම් දුරේ
තේවාවෙ හේවිසිය
පිරෙයි සිත බුදු බැතින්
පහන්වෙයි සිත් සතන්
ලියදි වට කෙත් යාය
දිසෙයි අරුණලු රඟන
ගලා යයි දිය කඳුරු
නිල් නිල් ව ගිරි සිරස
දළ උදුල ඇත් ගමන
සිහිව එයි වන අරණ
ඇසෙයි කවි තුන් සරණ
සුමන සමනොළ නගින

i. ඉහත නිර්මාණය සඳහා සුදුසු මාතෘකාවක් යොදන්න.
ii. (අ) පැහැදීම
(ආ) පාන්දර
යන වචන වෙනුවට පද්‍ය කොටසෙහි යොදා ඇති වචන මොනවා ද?
iii. **'නිල් නිල් ව ගිරි සිරස'** යන්නෙහි අදහස කුමක් ද?
iv. කිසියම් පොතක නමක් පද්‍ය කොටසෙහි ඇතුළත් ය. එම පොතේ නම උපුටා දක්වන්න.
v. (අ) සිහිව එයි
(ආ) දිසෙයි
යන ක්‍රියාපද පූර්ව ක්‍රියා බවට පෙරළන්න.

04. (අ) පහත සඳහන් ගද්‍ය කොටසට යෙදිය යුතු විරාම ලක්ෂණ නිවැරදි ව යොදා නැවත ලියන්න.

දේශීය වෛද්‍යවරයා නියම කළ **වාස මධු** නම් ඖෂධය උදේ සවස කෑමට පෙර ගතයුතු බව දැනගත් ඔහු පෙව 10 30ට නිවසින් පිටත් වූයේ ඖෂධාලයක් සොයා එය මිල දී ගැනීමට ය

(ලකුණු 05යි)

(ආ) පහත සඳහන් වාක්‍ය **අතීත කාල බහුවචනයට** හරවා නැවත ලියන්න.

i. මම ඉක්මනින් හැඳ පැළඳ උදෑසන ම පාසලට යමි.
ii. ගැහැනු ළමයා කළ වරදට ගුරුවරියගෙන් සමාව ගනියි.
iii. ඇතමෙක් ගුණය පෙන්වීමට විවිධ ක්‍රම යොදා ගනිති.
iv. මහ සුළඟට ගස ඉදිරී බිම වැටෙන්නේ ය.
v. දරුවා හිතට දිරිය ගෙන සමිතියේ කතා කළේ ය.

(ලකුණු 05යි)

05. කාරණය : සිසු කුසලතා ඇගයීම 2018
ස්ථානය : මොනරාගල මහානාම විද්‍යාලය - ශ්‍රවණාගාරය
දිනය : 2018 නොවැම්බර් 12
වේලාව : පෙ.ව. 10.00 ට
ප්‍රධාන ආරාධිත අමුත්තා : පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

ඉහත සඳහන් විස්තර උපයෝගී කරගනිමින් කළාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යැවීමට ආරාධනා පත්‍රයක් පිළියෙළ කරන්න.

(ලකුණු 15යි)